**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 - 2024**

---

**1. විගණන මතය**

1.1 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 42 හි තත්ත්වාගණනය කළ මතයන් ප්‍රකාශ කර ඇති අතර මේ සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 42 විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු 06 ක් විසින් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබූ අතර, මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂය සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 17 ක මූල්‍ය ප්‍රකාශනවල තොග අගය කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියද ගොවිජන සේවා කාරක සභා 9 ක ජංගම නොවන වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රතිපත්තිය ද හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන තුළ තොග අගය කිරීමට අදාළ සහ වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අවසන් තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු වුවද, කාරක සභා 17 ක් විසින් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව තොගය පිරිවැය මත අගය කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවසන් තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 22 ක් සතුව පවතින ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේ දී වටිනාකම තක්සේරු කර ඇතුළත් කරන බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ දී ගොවිජන බැංකු හා කාරක සභා 24 ක් සඳහා මිලදී ගන්නා ලද රු.18,128,928 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 85 ක් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 10 ක් වෙත ලබා දී තිබුණු බීජ සිටුවන යන්ත්‍ර 08 ක, වල් නෙලන යන්ත්‍ර 06 ක, පැල සිටුවන යන්ත්‍ර 11, ජල ටැංකි 07 ක, වතුර මෝටර් 02 ක, තණකොළ කපන යන්ත්‍ර 04 ක, ස්මාර්ට් බෝඩ් 01 ක, රූපවාහිනී යන්ත්‍ර 02 ක, ටැෆේ ට්‍රැක්ටරයක, රෝද දෙකේ ට්‍රැක්ටරයක හා ටේලරයක, කොළ මඩින යන්ත්‍ර 02 ක, ඩිස් නගුලක, පස් වැටි දමන යන්ත්‍රයක, තල සූනාමියක, ජංගම බොයිලේරුවක, බීජ ගලවන යන්ත්‍රයක, ලැප්ටොප් පරිගණකයක හා කොම්පෝස්ට් හලන යන්ත්‍රයක වටිනාකම හඳුනාගෙන දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මෙම යන්ත්‍රවල වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගොවිජන සේවා කාරක සභාව සතු යන්ත්‍ර සහ උපකරණ වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරන ලද එකතුව රු.431,927 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම | ඉදිරියේ දී වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 06 ක ජංගම නොවන වත්කම් අයිතම 22 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ක්ෂය අගය රු.2,370,679 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.659,381 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් රු.1,711,298 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා නිවැරදි කරන බව. | වර්ෂයට අදාළ ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පතු පොලිය රු.290,179 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර තැන්පත් පොලී නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් කළ යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ අලෙවිසැල් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දරන ලද රු.302,585 ක ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | යකල්ල ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂ අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම්වල ලී බඩු හා උපකරණවල ශේෂය දැක්වීමේ දී ලී බඩු හා උපකරණවලට අදාළ සමුච්චිත ක්ෂය රු.422,453 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලී බඩු උපකරණ පිරිවැයෙන් නිවැරදි සමුච්චිත ක්ෂය අගය අඩුකර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ගොවිජන සේවා කාරක සභා 15 ක සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල දී මිල දී ගන්නා ලද රු.10,658,409 ක යන්ත්‍රෝපකරණවලට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම වූ රු.1,454,443 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම් ගත කළ යුතුය. |
| (ඒ) | රනෝරාව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂ අවසානයේ පැවති වටිනාකම රු.3,789,000 ක MOP පොහොර කිලෝ ග්‍රෑම් | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තොග වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 21050 ක තොගය ඉතිරි තොගයට ගෙන නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම වත්කම් හා අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඔ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ජංගම නොවන වත්කම් අයිතම 07 කට අදාළ එකතු වටිනාකම රු.1,222,680 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.420,185 ක් ලෙස දැක්වීමෙන් ජංගම නොවන වත්කම් රු.802,495 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රධාන කාර්යාලය මඟින් එම වත්කම්වලට අදාළ වියදම ගොවිජන බැංකුවේ සමුච්චිත අරමුදලට කපා හැරීමට ලබා දුන් උපදෙස් අනුව වත්කම් ලෙස ගිණුම් ගත කළ නොහැකි වූ බව. | ගොවිජන බැංකුව විසින් මිලදී ගන්නා ලද වත්කම් ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කළ යුතුය. |
| (ඕ) | තන්තිරිමලේ ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය වර්ෂයේ ගිණුම් ගත නොකළ යන්ත්‍ර අයිතම 04 ට අදාළ රු.924,776 සමුච්චිත ක්ෂය වටිනාකම සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට හා ජංගම නොවන වත්කම් ශේෂයට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමුච්චිත අරමුදලට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ක්ෂය වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපීම් කර ජංගම නොවන වත්කම්වලින් අඩු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) | කැකිරාව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු ගොවිජන බැංකු ලාභාංශය ලෙස රු.1,172,429 ක් ගිණුම්ගත කර තිබුණද, ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශනවල ගොවිජන සේවා කාරක සභාවට ගෙවිය යුතු ලාභාංශ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කටයුතු කර ගොවි බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙවිය යුතු ලාභාංශ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු යුතුය. |
| (ග) | ගොවිජන සේවා කාරක සභා 34 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ණය ගැතියන් සඳහා බොල් ණය වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී අදාළ වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ණයගැතියන් සඳහා අදාළ වෙන් කිරීම් සිදු කළ යුතුය. |
| (ඞ) | ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් අක්කර බදු, ස්ථාවර තැන්පත් පොලී, බැංකු ගාස්තු හා ප්‍රාග්ධන පොලී වැනි ඇතැම් ආදායම් හා වියදම් මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් හා වියදම් උපචිත පදනමට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ච) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) වගන්තිය ප්‍රකාරව කාරක සභාව සතු ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා වාහන පිළිවෙලින් මූලික වටිනාකමින් සියයට 05 හා 20 | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීමට කටයුතු කළ යුතු අතර, ඊට අදාළ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ |

| | | |
|---|---|---|
| බැගින් ද, ලී බඩු හා උපකරණ හීනවන ශේෂය මත සියයට 10 බැගින් ද ක්ෂය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ඊට පටහැනිව ක්ෂය කිරීම් සිදු කර තිබුණි. | | යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පලුගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයට අනුව වත්කම්වල ශුද්ධ අගය රු.200,183 ක් වුවද, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ රු.1,162,000 ක් ලෙස දැක්වීමෙන් රු.961,817 ක වෙනසක් පැවතුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | විධිමත් පිරිදි සැසඳීම් කර ස්ථාවර වත්කම් ලේඛනය අනුව ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02 ක ස්ථාවර වත්කම් ලේඛනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ස්ථාවර වත්කම් ශේෂය අතර රු.1,023,813 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇතාකඩ ගොවිජන සේවා කාරක සභාවේ ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ලී බඩු හා උපකරණ අවසන් ශේෂය රු.690,500 ක් වුව ද, එය රු.1,031,456 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගෙනවිත් තිබීමෙන් රු.340,956 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 02 ක හා ගොවිජන බැංකුවක මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ශේෂ පිරික්සුමේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය හා 2024 ජනවාරි 01 දිනට ශේෂය අතර අයිතම 10 කට අදාළව එකතුව රු.1,839,606 ක වෙනසක් පැවතුණි. | යතුරු ලියන දෝෂයකින් සිදු වී ඇති බව හා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට කැබිතිගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ පොහොර තොග ලේඛන හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව ශේෂයන් අතර තොග | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි සැසඳීම් කර තොග ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයිතම 04 කට අදාළව රු.5,774,291 ක වෙනසක් පැවතුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඇතාකඩ ගොවිජන සේවා කාරක සභාවේ තොග ලේඛනය අනුව සහනාධාර යූරියා පොහොර තොගය කිලෝග්‍රෑම් 20900 ක් වූ අතර ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව එම ශේෂය කිලෝග්‍රෑම් 28058 ක් වීමෙන් කිලෝග්‍රෑම් 7158 ක වෙනසක් විය. | අත්වැරදීමකින් ප්‍රමාණාත්මක තොග ගිණුමේ සිදු වූ වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට කපුගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සහනාධාර පොහොර තොගය රු.3,924,880 ක් වූ අතර ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව එම ශේෂය රු.594,102 ක් වීමෙන් රු.3,330,778 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඌ) | ගොවිජන බැංකු 02 ක මූල්‍ය ප්‍රකාශන හා ණයගැති ලෙජරය අතර ශේෂයන් 06 කට අදාළව රු.183,517 ක වෙනසක් විය. | පාලන ගිණුම් යාවත්කාලීන කර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් පිරිදි සැසඳීම් කර නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත කළ යුතුය. |
| (ඔ) | ගොවිජන සේවා කාරක සභා 08 ක මූල්‍ය ප්‍රකාශන සහ ලෙජර් ගිණුම් අතර ශේෂයන් 22 කට අදාළව රු.2,468,672 ක වෙනසක් විය. | ලෙජරය යාවත්කාලීන කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

### 1.1.4 අවිනිශ්චිත ගිණුම්

| | කාරක සභාව | විෂය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | රනෝරාව | ජංගම වත්කම් | 2,214 | 1985 වර්ෂයේ සිට | 1985 සිට ඉදිරියට එන ශේෂයක් බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂ කඩිනමින් එම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගම්බිරිගස්වැව | වගකීම් (බැංකු) | 705,714 | හඳුනාගත නොහැකි | ඉදිරි වර්ෂයේ හඳුනාගෙන නිරවුල් | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | ශේෂයකි. | කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ) | අනුරාධපුර | වෙනත් ආදායම් (හඳුනාගත නොහැකි ආදායම) | 30,000 | 2024 | කරුණු සොයාගත නොහැකි වූ බව. | - එම - |
| (ඇ) | කපුගොල්ලෑව | ජංගම වගකීම් (භාරකාර අරමුදල) | 185,680 | 2006 වර්ෂයේ සිට | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | පේමඩුව | ජංගම වගකීම් (අවිනිශ්චිත ගිණුම) | 358,861 | 2024 | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඊ) | ශ්‍රාවස්තිපුර | ජංගම වත්කම් (ආදායමට වැඩි වියදම) | 400,103 | 1998 වර්ෂයේ සිට | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (උ) | ආඩියාගල | අවිනිශ්චිත ගිණුමේ ශේෂය | 611 | 2020 වර්ෂයේ සිට | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඌ) | මඩාටුගම | අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය | 786,172 | පැරණි ශේෂයකි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (එ) | කල්ලංචිය | තොග ඌණය | 68,731 | 2024 | පිළිතුරු ලබා දී නැත. | - එම - |
| (ඒ) | කැකිරාව | අවිනිශ්චිත ගිණුමේ ශේෂය | 557,660 | වසර ගණනාවක සිට පැවත එන ශේෂයකි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

### 1.1.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 36 කට අදාළ එකතු වටිනාකම රු.45,484,532 ක් වූ ජංගම නොවන වත්කම් විෂයයන් 61 ක්, එකතු වටිනාකම රු.315,899,017 ක් වූ ජංගම වත්කම් විෂයයන් | 2025 වර්ෂයේ ගිණුම් වාර්තාවල මෙම අඩුපාඩු සකස් | වත්කම්, වගකීම්, ආදායම් හා |

| | | |
|---|---|---|
| 71 ක්, වටිනාකම රු.2,486,925 ක් වූ ජංගම නොවන වගකීම් විෂයයන් 02 ක්, එකතු වටිනාකම රු.336,878,081 ක් වූ ජංගම වගකීම් විෂයයන් 50 ක්, එකතු වටිනාකම රු.21,736,391 ක් වූ ආදායම් විෂයයන් 27 ක් හා එකතු වටිනාකම රු.8,151,062 ක් වූ වියදම් විෂයයන් 18 ක්, ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛන, ස්ථාවර තැන්පත් සහතික, යාවත්කාලීන කරන ලද ණය ගැති ලේඛන, යාවත්කාලීන කරන ලද ණය හිමි ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, තුලනය කරන ලද ලෙජර් ගිණුම්, තොග ලේඛන, මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන, තැන්පත් ලේඛන, බැංකු පාස් පොත්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් ගොවීන්ට ලබා දුන් පොහොර වවුචර් සම්බන්ධ තොරතුරු, ණය ලබා ගැනීමට අදාළ ගිවිසුම්, ණය ගෙවීම් වාර්තා, ගොඩ ඉඩම් ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය, ආදායම් හා වියදම් ලේඛන නොමැතිවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | කර නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන, සටහන්, වාර්තා සනාථ කිරීම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | වියදම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| | (i) 53 (i) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 07 ක් සඳහා printer යන්ත්‍ර මිලදී ගැනීමට එකතු වටිනාකම රු.446,040 ක් ද, ගොවිජන බැංකු 22 ක් සඳහා මෘදුකාංග හා ස්කැනර් යන්ත්‍ර මිලදී ගැනීමට එකතු වටිනාකම රු.845,169 ක් ද ගෙවීම් කර තිබුණු නමුත් එම වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබී නොතිබුණද එම වටිනාකම් ලැබිය යුතු ශේෂ ලෙස දැක්වීමෙන් තොරව වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 53 (4) (අ) වගන්තිය | සෑම අවුරුදු තුනකට වරක් සෑම කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක්ම කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කරනු ලැබිය යුතු වුවත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 27 කට අයත් වසම් 407 ක කුඹුරු ඉඩම් නාම ලේඛන කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කර නොතිබුණි. | සංශෝධනවලට ලක්ව ලේඛන පිළියෙල කර කොමසාරිස් වෙත ඉදිරිපත් කරන බව හා අදාළ ලේඛන සහතික කර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 104(6) | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන්ම දැනගැනීම සඳහාත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවද, සිවලාකුලම ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්ගේ 2025 ජූනි 20 දිනැති ලිපිය ප්‍රකාරව 2023 වර්ෂයට පෙර සිදුවී තිබුණු රු.241,980 ක් වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | කඩිනමින් පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුත්තන් නිශ්චය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 137 | අනුමත කරන ලද වවුචර් සඳහා පමණක් මුදල් ගෙවිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 08 ක එකතු වටිනාකම රු.13,235,132 ක් වූ වවුචර් 225 ක් සඳහා අනුමත කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. | අත්සන් ලබා ගෙන අනුමත කර ඇත. ඉදිරියේ දී අනුමත කරන ලද වවුචර් පත් සඳහා පමණක් මුදල් ගෙවන ලෙස අදාළ නිලධාරීන් | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමත කරන ලද වවුචර් සඳහා පමණක් |

| | | | |
|---|---|---|---|
| | | දැනුවත් කර ඇති බව | මුදල් ගෙවිය කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 137(5) | සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂාකොට නිවැරදිව භාරගෙන තිබෙන බවට සත්‍යායනය ගෙවීම් අනුමත කරන නිලධාරියාගේ වගකීමක් වුවද ගොවිජන සේවා කාරක සභා 07 ක් සඳහා Printer යන්ත්‍ර මිලදී ගැනීමට එකතු වටිනාකම රු.446,040 ක්ද, ගොවිජන බැංකු 22 ක් සඳහා මෘදුකාංග හා ස්කෑනර් යන්ත්‍ර මිලදී ගැනීමට එකතු වටිනාකම රු.845,169 ක් සඳහා භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් සිදු කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉල්ලුම් කළ භාණ්ඩ ලැබුණු බවට සනාථ කර ගැනීමෙන් පසුව පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) මුදල් රෙගුලාසි 139 | එකතු වටිනාකම රු.3,886,959 ක් වූ ගොවිජන සේවා කාරක සභා 06 ක වවුචර් 72 ක් හා එකතු වටිනාකම රු.5,224,950 ක් වූ ගොවිජන බැංකු 03 ක වවුචර් 58 ක් සඳහා සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. | මේ වන විට සහතික කිරීමට කටයුතු කර ඇති බව හා නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික කරන ලද වවුචර් සඳහා පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (v) මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් මුදල ලැබුණු බවට තහවුරු කිරීමක් ලබාගත යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 08 ක එකතු වටිනාකම රු.4,902,819 ක් වූ වවුචර් 114 ක් සම්බන්ධයෙන් එපරිදි තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි. | කුවිතාන්සි ලබා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් මුදල |

| | | | |
|---|---|---|---|
| | | | ලැබුණු බවට තහවුරු කිරීමක් ලබාගත යුතුය. |
| (vi) මුදල් රෙගුලාසි 272 (3) | ගෙවූ වවුචර් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් දෛනික මුදල් ගෙවීම් ලේඛනයේ ඇතුළත් කර තිබුණු එකතුව රු.6,231,775 ක් වූ වියදම් අයිතම 10 ක් සඳහා වූ ගෙවීම් වවුචර් 10 ක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | මෙම වවුචර් දිස්ත්‍රික් කාර්යාලය වෙත යවා ඇති බැවින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව | අදාළ හිඟ වවුචර් විගණනය වෙත ඉදිරිපත් කිරීමටත්, එසේ නොමැති නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) 1981 ඔක්තෝබර් 16 දිනැති ගොවිජන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 107 | | | |
| (i) 21.2 ඡේදය | ලේකම්වරයා විසින් අඩු වශයෙන් දෙසතියකට වරක්වත් තොග පොත් පරීක්ෂා කර එහි ඇති කරුණු නිවැරදි බවට සෑහීමකට පත් වී තොග පොත් අත්සන් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 11 ක ඊට අනුකූලව අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) 30.2 ඡේදය | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂයන්ගේ නිවැරදි බව අදාළ ණයගැතියන්ගෙන් තහවුරු කරගෙන එම තහවුරු කිරීම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 21 ක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී තහවුරු ලිපි ලබා ගැනීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 30 ඡේදයේ 3 (vii) | මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතු වුවත්, පලුගස්වැව ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - |
| (ඈ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවි බැංකු චක්‍රලේඛයේ | | | |
| | (i) 2.4.1 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් ගොවි ජනතාව දිරි ගන්වා නිෂ්පාදන ක්‍රියාවලියට හා විකුණුම් කටයුතුවලට පොළඹවාලීමේ සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේ දී සැලැසුම් සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| | (ii) 3.15 (i) | ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් අනුමත ගොවීන්ගේ නම් ලැයිස්තුව කන්න ආරම්භයේ දීම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රදර්ශනය කර නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඉ) | 2016 පෙබරවාරි 09 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු විසින්ම අවම වශයෙන් මාස 04 කට වරක්වත් ගොවි සංවිධාන පරීක්ෂා කර ගොවි සංවිධාන පරීක්ෂණ වාර්තාවක් ගොවිජන සංවර්ධන නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 14 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2022 දෙසැම්බර් 28 දිනැති අංක 04/2012 (සංශෝධිත vii) චක්‍රලේඛය | ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියක තබා ගත යුතු අත ඉතිරි මුදලේ උපරිම සීමාව රු.50,000 ක් වුවද, ගොවිජන බැංකු 18 ක 2024 වර්ෂය තුළ අවස්ථා 515 ක දී රු.50,000 සිට රු.1,333,466 ක පරාසයක් දක්වා මුදල් අත රඳවාගෙන තිබුණි. | සවස 03 න් පසු මුදල් ලැබීම, බැංකු ශාඛා දුරින් පිහිටීම හා පළුදු වූ මුදල් යන්ත්‍රය මඟින් ප්‍රතික්ෂේප කරන බැවින් මෙසේ සිදු වී ඇති බවත් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම -. |
| (උ) | 2023 ඔක්තෝබර් 05 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 7/5/9-05 (මෙහෙ.ප) 3 වෙළුම ලිපිය | බුල්නෑව ගොවිජන සේවා කාරක සභාව විසින් මිල ගණන් සසඳා බැලීමකින් තොරව 2024 අප්‍රේල් 25 දින පුද්ගලික සමාගමකින් රු.428,750 ක් වටිනා යූරියා කිලෝ ග්‍රෑම් 2450 ක් මිල දී ගෙන තිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් 7/5/9-05 (මෙහෙ.පො.) ලිපිය අනුව මිල කැඳවීම් සිදු කිරීම් අත්‍යාවශ්‍ය නොවන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 1978 දෙසැම්බර් 19 වන දින අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය (178) | ආයතනය සතුව පවතින සියලුම ස්ථාවර වත්කම් විස්තර ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත්, කැකිරාව ගොවිජන සේවා කාරක සභාව සතුව පවතින ශුද්ධ අගය රු.1,617,233 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.39,735,294 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,282,612 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,547,318 ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර, ගොවිජන බැංකු 42 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.16,268,775 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.20,937,533 ක් විය. ඒ අනුව බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,668,758 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවා සැපයුම් ආදායම රු.30,750,745 කින් ද, ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන යටතේ උපයන ආදායම් රු.3,981,719 කින් ද, මෙහෙයුම් නොවන ආදායම් රු.11,849,660 කින්, වෙනත් ආදායම් රු.1,462,211 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 04 ක ජංගම ගිණුම්වල එකතු වටිනාකම රු.23,634,449 ක මුදලක් රඳවාගෙන තිබුණු අතර, විධිමත් අනුමැතිය යටතේ එම මුදලින් ප්‍රමාණවත් කොටසක් ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ලැබිය හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | ස්ථාවර තැන්පත් ගිණුමක මුදල් තැන්පත් කිරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතිය යටතේ අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සාලියපුර ගොවිජන සේවා කාරක සභාවේ 2016 වර්ෂයේ සිට සිදු වූ ගණුදෙනු පිළිබඳව ලේඛණ හා බැංකු ප්‍රකාශන වාර්තාවලට අනුව හදුනාගෙන තිබුණු රු.1,166,098 ක් වූ අත ඉතිරි මුදල් ඌණතාවය සඳහා වූ හේතු හදුනාගෙන වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් මූලික පරීක්ෂණයක් සිදුවන බැවින් පරීක්ෂණයේ තීරණ අනුව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විමර්ෂණ කටයුතු කඩිනමින් සිදු කර අදාළ පුද්ගලයන්ගෙන් අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සාලියපුර ගොවිජන සේවා කාරක සභාවේ 2019 වර්ෂයේ සිට පැවත එන වවුචර් නොමැති ගෙවීම් ලෙස සටහන් කරන ලද රු.354,268 ක් වූ ගෙවීම් ද, 2015 වර්ෂයේ සිට මුල්‍ය ප්‍රකාශනවල අගරු චෙක්පත් ලෙස දක්වා ඇති එහෙත් බැංකුවෙන් මුදල් ගෙවන ලද රු.33,230 ක හදුනා නොගත් ගෙවීම් හා 2018 වර්ෂයේදී චෙක්පත් මඟින් ගෙවීම් කළද ගෙවීම් පිළිබඳ කිසිදු සටහනක් නොමැති රු.57,274 ක ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පුද්ගලයන්ගෙන් හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් මූලික පරීක්ෂණයක් සිදුවන බැවින් පරීක්ෂණයේ තීරණ අනුව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූලික පරීක්ෂණ සිදු කර පරීක්ෂණ තීරණ අනුව අවශ්‍ය ක්‍රියාමර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 30 දින චෙක්පතක් මඟින් රු.11,727,200 ක මුදලක්, අනුරාධපුර ගොවිජන සේවා කමිටුවේ ජංගම ගිණුමේ තැන්පත් කර 2024 වර්ෂයේ දී වරින් වර එකතුව රු.8,632,400 ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණු අතර, රු.3,094,800 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තවදුරටත් පැවති අතර, වෙනත් | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් තැන්පත් කිරීම් හා ආපසු ගැනීම් පිළිබඳව හා ඊට අදාළ අනුමැතිය පිළිබඳව විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ශවයක මුදල් කමිටු ජංගම ගිණුමේ රඳවාගෙන පැවතීමට හේතු විගණනයට ඉදිරිපත් නොවීය. | | |
| (ඉ) | යකල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් 2024 දෙසැම්බර් 30 දිනට කමිටු ජංගම ගිණුමේ මුදල් ශේෂය රු.66,872 ක්ව තිබිය දී 2024 දෙසැම්බර් 30 හා 31 දිනයන්වලදී එකතුව රු.1,009,100 ක් වටිනා චෙක්පත් 02 ක් නිකුත් කර තිබුණි. | ඉතිරි කිරීමේ ගිණුමෙන් ජංගම ගිණුමට මුදල් මාරු කරන ලෙස බැංකුව දැනුවත් කළ ද මුදල් මාරු කර නොතිබුණු බව. | ජංගම ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් පවතින බව පරීක්ෂා කර බැලීමෙන් පසුව චෙක්පත් නිකුත් කළ යුතු අතර, බැංකු අයිරා පොළිය නොගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයට අයත් වී තොග සහල් කර රජයේ ගබඩාවලට ලබා දීමේ වැඩසටහන යටතේ තලාව ගොවිජන සේවා කාරක සභාව විසින් 2006 වර්ෂයේ දී වී මෝල් හිමියෙකු වෙත ලබා දෙන ලද වී තොගයක් සහල් කර ආපසු භාර නොදීම හේතුවෙන් වී මෝල් හිමියෙකුගෙන් අයකර ගත යුතු රු.4,341,936 ක ශේෂය අයකර ගැනීම සඳහා අනුරාධපුර මහාධිකරණයේ නඩු පවරා තිබුණු අතර, වී මෝල් හිමියා මිය යාම හේතුවෙන් ණය ශේෂය අය කර ගැනීමට නොහැකි වීමෙන් කාරක සභාවට එම ප්‍රමාණයෙන් අලාභයක් සිදු වී තිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | නියමිත කාලය තුළ ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 32 ක මූල්‍ය ප්‍රකාශනවල වසර ගණනාවක සිට පැවත එන එකතු වටිනාකම රු.272,651,704 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 261 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව අයකර ගැනීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 29 ක මූල්‍ය ප්‍රකාශනවල වසර ගණනාවක සිට දිගින් දිගටම පැවත එන රු.258,650,295 ක් වූ ගෙවිය යුතු ශේෂ 210 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පලාගල ගොවිජන සේවා කාරක සභාව විසින් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් පවත්වන අතර ඉන්පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව, සමුච්චිත අරමුදලට ගැලපීමට උපදෙස් ඉල්ලා ඇති බව හා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර සනාථ කර ගැනීමෙන් පසු ගෙවිය යුතු වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිවල රාජකාරි කාර්යක්ෂමව හා තෘප්තිමත්භාවයෙන් යුතුව ඉටු කර ගැනීමේ අරමුණින් යුතුව ගොවිජන සේවා කාරක සභා හා ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය සඳහා සකස් කෙරෙන මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු 38 ක් හා ගොවිජන සේවා කාරක සභා 32 ක් සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීමට එකතුව රු.21,835,674 ක් 2023 හා 2024 වර්ෂවල දී ගෙවීම් කර තිබුණ ද, අදාළ මෘදුකාංගය හා ස්කෑනර් යන්ත්‍ර 2024 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණු අතර, මෘදුකාංගය 2025 ජුලි 11 වන විට ද ස්ථාපනය නොකිරීම හේතුවෙන් එතෙක් මිලදී ගත් උපකරණ නිශ්කාර්ය බවට පත් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර මෘදුකාංගය ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන බවත්, තාක්ෂණික උපදෙස් , අවශ්‍ය පුහුණුව හා මඟපෙන්වීම ලැබුණු පසු භාවිතා කිරීමට කටයුතු කරන බව. | අදාළ මෘදුකාංගය කඩිනමින් ස්ථාපනය කර අවශ්‍ය පුහුණුව හා මඟපෙන්වීම ලබා දී විධිමත් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශ 16 ක් තුළ ගොවි පවුල් 6920 ක් ප්‍රතිලාභ ලබන කුඹුරු අක්කර 8225.75 කට ජලය සැපයීමට හැකි ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත සුළු වාරි වැව් 195 ක් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කර නොතිබීමෙන් අලුතින් අස්වැද්දිය හැකි කුඹුරු අක්කර 556.85 ක් අස්වැද්දීමට නොහැකි වී තිබුණි. | අධික වර්ෂාව හේතුවෙන් නියමිත කාලය තුළ අලුත්වැඩියා කිරීමට නොහැකි වූ බව හා ප්‍රමුඛතා ලේඛනය අනුව ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | ප්‍රතිසංස්කරණය කළ යුතු සුළු වාරි වැව් ප්‍රතිසංස්කරණය කිරීමෙන් අලුතින් අස්වැද්දිය හැකි කුඹුරු ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 05 ක එකතු වටිනාකම රු.1,209,604 ක් වූ පොහොර තොග 2024 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී තිබුණු අතර එම පොහොර කල් ඉකුත් වීමට පෙර නිසි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | නියෝජ්‍ය කොමසාරිස් උපදෙස් පරිදි තොගය ඉවත් කිරීමට කටයුතු කරන බව. | පොහොර තොග කල් ඉකුත් වීමට පෙර වගා කටයුතු සඳහා යොදා ගැනීමට හෝ අතිරික්ත තොග ආපසු යැවීමට කටයුතු කළ යුතු අතර එසේ නොකළ |

| | | | |
|---|---|---|---|
| | | | පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඊ) | සිවලාකුලම ගොවිජන සේවා කාරක සභාව සතු තොග ගබඩාවේ පොහොර අක්‍රමවත් ලෙස ගබඩා කර තිබුණු අතර, ජල ගැලීම් හේතුවෙන් කිලෝග්‍රෑම් 352 ක TSP පොහොර ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි ආකාරයෙන් විනාශයට පත් වී තිබුණි. | ඉදිරියේ දී ගබඩාව ක්‍රමානුකූලව පවත්වාගෙන යන බව. | ගබඩා කිරීමේ දී පොහොර ක්‍රමවත් ලෙස ගබඩා කළ යුතු අතර, විධිමත් පරිදි කටයුතු කර නොමැති පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (උ) | 2002 අගෝස්තු 20 දින තඹුත්තේගම ගොවිජන සේවා කාරක සභාව වෙත ජපන් "යෙන්" ආධාර යටතේ ලබා දී තිබුණු වී පාහින මෝල එය පිහිටි ස්ථානයේ පවත්නා ඉඩකඩ සීමිත වීමත්, ක්‍රියාත්මක කිරීමෙන් පාරිසරික ගැටලු ඇති වීමත්, වී සහල් කිරීමට උත්සාහ කළ ද එය අසාර්ථක වීමත් හේතුවෙන් 2025 මාර්තු 20 දින වන විටත් භාවිතයට නොගෙන අක්‍රියව පැවතුණු අතර, ප්‍රමාණවත් ඉඩකඩ සහිත සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීමට කටයුතු නොකිරීමෙන් ලබා ගත හැකිව තිබුණු ප්‍රතිලාභ අහිමි වී තිබුණි. | සීමිත ඉඩකඩ හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකි බව. | ප්‍රමාණවත් ඉඩකඩ සහිත සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | කොවිඩ් 19 හදිසි තත්ත්වය මත ලෝක බැංකු ආධාර යටතේ ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී ඉදිකර රාජාංගනය, මරදන්කඩවල හා පදවි පරාක්‍රමපුර ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා ලබා දී තිබුණු පිළිවෙලින් වර්ගඅඩි 818, 2567 හා 2567 ප්‍රමාණයේ එකතු වටිනාකම රු.27,552,497 ක් වූ බීජ ගබඩා 03 ක් හා එකී ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉදිකර සාලියපුර ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දී ඇති වර්ගඅඩි 2520 ක් වූ වටිනාකම සඳහන් නොවූ බීජ ගබඩාව මෙම ගොවිජන සේවා බල ප්‍රදේශ තුළ ගබඩා කිරීමට තරම් වෙනත් භෝග වගාවන් සිදු නොකරන බැවින් 2025 ජුලි 14 මස දක්වාම භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. තවද, උක්ත ව්‍යාපෘතිය යටතේ ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ බීජ ගබඩාව ඉදිකිරීම සඳහා පළමු කොටස් ගෙවීම වශයෙන් රු.2,954,945 ක් ගෙවීම් කර තිබුණු අතර 2025 ජුලි 14 දින දක්වාම එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගොවිජන සේවා බල ප්‍රදේශ තුළ ගබඩා කිරීමට තරම් වෙනත් බෝග වගාවන් සිදු නොකරන බව. | බීජ ගබඩාවලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | නොච්චියාගම ගොවිජන සේවා කාරක සභාවේ එකතු වටිනාකම රු.281,945 ක් වූ තොග අයිතම් 15 කට අදාළව වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එන තොග ඌණතාවයන් සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන එම වටිනාකම් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තු මගින් පරීක්ෂණයක් පවත්වාගෙන යන බව. | පරීක්ෂණ කඩිනම් කර වගකිවයුත්තන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | විකුණා මුදල් ගෙවීමේ පදනම මත පලාගල ගොවිජන සේවා කාරක සභාව විසින් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත ලබාදුන් පොහොරවලින්, 2024 දෙසැම්බර් 31 දිනට නිලධාරී 07 දෙනෙකුගෙන් තවදුරටත් රු.2,563,602 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | මේ සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදු කරනු ලබන බව හා පරීක්ෂණය අවසන් වීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | විධිමත් පරිදි කටයුතු කර අදාළ නිලධාරීන්ගෙන් ලැබිය යුතු මුදල් නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් ජපන් ආධාර යටතේ 2010 වර්ෂයේ දී රු.250,000 ක මුදලකට ගොවීන් 14 දෙනෙකුට ගෙවීම් ක්‍රමය යටතේ ලබා දුන් රෝද දෙකේ අත්ට්‍රැක්ටර් 14 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මාර්තු 26 දිනට රු.2,356,380 ක මුදලක් අයවීමට තිබුණු අතර, එම මුදල් අයකර ගැනීමට හෝ එම ට්‍රැක්ටර් රථ ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත පවරාගැනීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | එම ට්‍රැක්ටර් අත්පත් කර ගැනීමට නීතිමය වශයෙන් කටයුතු කරමින් පවතින බව. | විධිමත් පරිදි කටයුතු කර හිඟ මුදල් අයකිරීමට හෝ ගොවිජන සේවා මධ්‍යස්ථානයට එම ට්‍රැක්ටර් පවරා ගැනීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඕ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 40 ක් විසින් රු.2,130,000 ක් වියදම් දරා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රවලින් ඇඟිලි සලකුණු යන්ත්‍ර 26 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අක්‍රියව පැවතුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් (සේවා) ගේ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 7/5/7-01 දරන ලිපිය අනුව ගොවිජන සේවා මධ්‍යස්ථානවල සේවය කරන සියලුම නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර සෑම මසකම 15 දිනට පෙර පැමිණීමේ හා පිටවීමේ වාර්තා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත යවන ලෙසත්, අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ 2021 මාර්තු 01 දිනැති අංක 19/03/05/04/05 (v) දරන ලිපිය අනුව සෑම මසකම 05 වන දිනට පෙර | මේ සම්බන්ධ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර ඇති අතර, මිලදී ගත් ආයතනය දැනට නොමැති බැවින් දිස්ත්‍රික් කාර්යාලය හරහා එය අලුත්වැඩියා කිරීමට හෝ නව යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංගය ලබා දීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරන නිලධාරීන්ට පියවර ගත යුතුය. |

පැමිණීමේ හා පිටවීමේ වාර්තා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලෙසත් දන්වා තිබුණ ද, මධ්‍යස්ථාන විසින් පැමිණීමේ හා පිටවීමේ වාර්තා නියෝජ්‍ය කොමසාරිස් වෙත යවා නොතිබීමෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 26 ක් විසින් 2023 සහ 2024 වර්ෂ Geo Goviya වැඩසටහනට අදාළව එකතුව රු.27,125,879 ක වියදමක් 2024 දෙසැම්බර් 31 දින වන විට දරා තිබුණ ද, අදාළ පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2024/2025 මහ කන්නයට අදාළව පොහොර බෙදා දීමේ වැඩසටහන සඳහා Geo Goviya දත්ත පද්ධතිය භාවිතා කිරීමට නොහැකි වී තිබීමෙන් ඒ සඳහා මෙතෙක් දැරූ වියදම්වලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | තාක්ෂණික කටයුතු අවසන් වන තෙක් agrarian.lk වෙබ් අඩවිය මඟින් ඉදිරි කටයුතු සිදු කරන බව හා අවශ්‍ය පුහුණුව හා මහ පෙන්වීම ලැබුණු පසු අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කරන බව | විධිමත් වැඩපිළිවෙලක් යොදා අවශ්‍ය තොරතුරු දත්ත පද්ධතියට කඩිනමින් ඇතුළත් කර පොහොර බෙදා හැරීමේ කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | Geo Goviya වැඩසටහන යටතේ ගොවිජන සේවා බල ප්‍රදේශ 24 ක මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කැබලි 179,663 කින් කැබලි 159,041 ක් මිනුම් සිදු කර, සිතියම් ගත කර වැඩසටහනට ඇතුළත් කර තිබුණු අතර, කැබලි 19,262 ක් මිනුම් සිදු කර, සිතියම් ගත කර වැඩසටහනට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පද්ධතියේ ගැටලු පවතින බැවින් සම්පූර්ණ කිරීමේ අපහසුතා පවතින බවත්, තාක්ෂණික දෝෂ නිවැරදි කර කඩිනමින් සිතියම් ගත කිරීමට කටයුතු කරන බව. | පද්ධතියේ පවතින දෝෂ නිවැරදි කර සිතියම් ගත නොකළ ඉඩම් කැබලි කඩිනමින් සිතියම් ගත කර Geo Goviya වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පොදු මුදල් කුවිත්තාසි 14 කින් එකතු කරන ලද එකතුව රු.308,500 ක ලැබීම් කල්ලංචිය ගොවිජන සේවා කාරක සභාවේ දෛනික මුදල් ලැබීම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | විධිමත් පරීක්ෂාවක් සිදු කර මුදල් අවභාවිතාවක් සිදු වී තිබේ නම් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත්, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමත් කළ යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූනෑව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රබෝධගම වසමේ රාජකාරියේ නියුතු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියා විසින් නඩත්තු කරනු ලබන ලේඛනයේ ඇතුළත් මුළු කුඹුරු ඉඩම් වපසරියම ගොවි නාම ලේඛනයේ වගාකළ බිම් ප්‍රමාණය ලෙස ඇතුළත් කර 2023/2024 මහ, 2024 යල හා 2024/2025 මහ කන්න වලට අදාළව පොහොර මුදල් ලබාදීමේ දී තුලානය තුළ පදිංචි ගොවීන් 49 දෙනෙකුගේ ඉඩම් කට්ටි 59 ක වගා නොකළ බිම් හෙක්ටයාර් 47.5 ක් සඳහා රු.688,263 ක මුදලක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි. | අභ්‍යන්තර විගණන විමසුමට අනුව එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බවත් අදාළ නිලධාරියා මිය යාම හේතුවෙන් ඔහුගෙන් අයවිය යුතු මුදල් සම්බන්ධව ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් පතා ඇති බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වගකිව යුතු නිලධාරීන් තීරණය කර අදාළ අය කර ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පූනෑව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ 2023/2024 මහ, 2024 යල හා 2024/25 මහ කන්නවලට අදාළව තුලාන තුළ පදිංචි වී නොමැති පුද්ගලයින්ගේ නම්, හැඳුනුම්පත් අංක හා ගිණුම් අංක ඇතුළත් කරමින් කුඹුරු ඉඩම් හෙක්ටයාර් 59 ක් සඳහා රු.879,618 ක පමණ පොහොර සහනාධාර මුදලක් ව්‍යාජ ලෙස වැරදි ගිණුම් අංකවලට බැර කරගෙන තිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු පාර්ශව වෙත පියවර ගැනීමත් අදාළ මුදල් ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක් සතු එකතු වටිනාකම රු.670,480 ක් වූ වතුර මෝටර් 02 ක්, ගොයම් කපන යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණකයක්, ස්කෑනර් යන්ත්‍රයක්, කාබනික පොහොර අඹරන යන්ත්‍රයක් හා ඡායා පිටපත් යන්ත්‍රයක් වසර ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඇතැම් වත්කම් වෙන්දේසි කරන බව, ඇතැම් වත්කම් අලුත්වැඩියා කිරීමට හා කාබනික පොහොර අඹරන යන්ත්‍රය කුලී පදනම මත ගොවීන්ට ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන බව. | නිෂ්ක්‍රීය වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතු අතර, කාබනික පොහොර අඹරන යන්ත්‍රය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් වෙත 2021 වර්ෂයේ දී ලැබී තිබුණු කොම්පෝස්ට් හලන යන්ත්‍ර 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්පාදනයට යොදා නොගන්නා බැවින් වෙනත් ආයතනයකට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට හෝ විධිමත් පරිදි වෙනත් ආයතනවලට භාරදීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 14 ක් සතු බීජ සිටුවන යන්ත්‍ර 09 ක්, තල සුනාමි 01 ක්, සිස් නගුල් 01 ක්, පස් වැටි දමන මැෂින් 01 ක්, බීජ ගලවන යන්ත්‍ර 01 ක්, වල් නෙලන යන්ත්‍ර 02 ක්, පැරෂුට් තැටි 2000 ක්, වතුර මැෂින් 01 ක්, අත් ට්‍රැක්ටර් ටේලර් 01 ක්, තණකොළ කපන මැෂින් 03 ක්, රෝද 04 ට්‍රැක්ටර් 01 ක්, රෝද දෙකේ ට්‍රැක්ටර් 01 ක්, ජල උසමාපක 67 ක් හා බැග් මසන යන්ත්‍රයක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඇතැම් වත්කම් අලුත්වැඩියා කරන බව හා ජල උස මාපක සවි කිරීමට ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබා ගන්නා බව. | අලුත්වැඩියා කළ හැකි වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හා ජල උස මාපක සවි කිරීමටත් භාවිතයට ගත නොහැකි වත්කම් විධිමත් පරිදි අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 07 ක් සතු පරිගණක 07 ක්, ජංගම බොයිලේරු 01 ක්, ප්‍රින්ටර් 06 ක්, ෆැක්ස් යන්ත්‍ර 02 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 04 ක්, ශීතකරණයක් හා ආරක්ෂිත සේප්පුවක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කළ හැකි වත්කම් අලුත්වැඩියා කරන බව හා අනෙකුත් වත්කම් වෙන්දේසි කරන බව | නිෂ්ක්‍රීය වත්කම් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ විධිමත් පිරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක් සතු නිල නිවස අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් නිල නිවාස කුලී ආදායම් අහිමි වී තිබුණු අතර, නිල නිවස වටා භූමිය එළිපෙහෙළි කිරීමට කටයුතු නොකිරීමෙන් වල් බිහි වී තිබුණි. | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර ප්‍රතිපාදන ලබා ගෙන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | නිල නිවස අලුත්වැඩියා කර කුලී පදනම මත ලබා දීමට කටයුතු කළ යුතු අතර, පරිශ්‍රය විධිමත්ව තබාගත යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 03 ක අලෙවි සැල් වසර 05 කට අධික කාලයක සිට කිසිදු අලෙවි කටයුත්තකට යොදා ගෙන නොතිබුණි. | ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපිත කර ඇති බැවින් අනෙකුත් අලෙවිසැල් සමඟ තරඟ කළ නොහැකි බව. | විධිමත් පරිදි කටයුතු කර අලෙවිසැල් කුලියට ලබා දීමට හෝ මධ්‍යස්ථානයේ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | එක මිටට ගොවි බිමට වැඩසටහන යටතේ යකල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දුන් ගොවි සෙවන ගොඩනැගිල්ල 2020 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ගොවි මහතෙකු වෙත ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | මධ්‍යස්ථානය වෙත ලබා දුන් ගොඩනැගිලිවලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03 ක් සඳහා එකතු වටිනාකම රු.968,000 ක් වූ පරිගණක යන්ත්‍ර 03 ක් මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 වගන්තිය අනුව ලංසු ඇගයීම අවසන් කළ වහාම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙල කර සියලුම සනාථ කිරීම් ලේඛන සහිතව එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ලංසු ඇගයීම් වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුණ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 අනුව භාණ්ඩ ලැබුණු පසු සපයන ලද භාණ්ඩ, පිරිවිතරවලට සහ වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බවටත් වගකීම් සහතික, අත්පොත් එකඟ වූ අයුරින් සපයා ඇති බවටත් සහතික කර නොතිබුණි. | අදාළ මිල දී ගැනීමේ ආයතනය ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් විසින් අනුමත කරන බව හා උපදෙස් පරිදි ඉදිරි මිලදී ගැනීම් කටයුතු සිදු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය අනුව මිලදී ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04 ක බල ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 53 කින් වසම් 27 කට අදාළව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් 27 දෙනෙකු හා ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී තනතුරක් හා කළමනාකරණ සහකාර තනතුරක් ඇතුළුව තනතුරු 29 ක් සඳහා නිලධාරීන් පුරප්පාඩු වී පැවතුණි. | රජය මඟින් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් බඳවා ගැනීමේ දී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව හා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් මඟින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති බව. | කාර්ය මණ්ඩල විශ්ලේෂණයක් සිදු කර අත්‍යාවශ්‍යම පුරප්පාඩු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක රාජකාරි සිදුකරනු ලබන නිලධාරීන්ගෙන්, නිලධාරීන් 15 ක් අඛණ්ඩව වසර 06 සිට වසර 25 දක්වා කාලපරිච්ඡේදයක් එකම මධ්‍යස්ථානයක සේවය කරමින් සිටින අතර, මෙම | නිලධාරී හිඟය මේ සඳහා බලපා ඇති බව. | ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව එම නිලධාරීන් |

| | |
|---|---|
| නිලධාරින් සම්බන්ධව ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී නොතිබුණි. | ස්ථාන මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 30.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ගත වීමට පෙර වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සිවලාකුලම ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් දින 73 ක කාල ප්‍රමාදයකින් පසුව 2025 ජුනි 13 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නියමිත දිනට ගිණුම ඉදිරිපත් කරන බව. | නියමිත දිනට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**5. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසම තුළ කුඩා කණ්ඩායම් පිහිටුවීම හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කරගැනීම වසම භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ වගකීමක් වුවද, ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශ 21 ක පවතින ගොවි පවුල් 97198 න්, ගොවිජන බැංකුව සමඟ සම්බන්ධ වී කටයුතු කරන කුඩා කණ්ඩායම් ගණන 3368 ක් වැනි අවම ප්‍රමාණයක් විය. | කුඩා කණ්ඩායම් ගණන වර්ධනය කර ගැනීමට කටයුතු කරන බව. | වසම තුළ කුඩා කණ්ඩායම් පිහිටුවීමට හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කරගැනීමට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු 30 ක තැන්පත් වර්ග 08 කට අදාළ 98294 ක් වූ මුළු ගිණුම් සංඛ්‍යාවෙන් ගිණුම් 66025 ක් අක්‍රීය ගිණුම් ලෙස පැවති අතර, මෙම ගිණුම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා පියවර ගෙන නොතිබුණි. | අක්‍රීය ගිණුම් ක්‍රියාකාරී ගිණුම් බවට පත් කර ගැනීමට කටයුතු කරන බව. | විධිමත් වැඩපිළිවෙලක් යොදා ගොවිජන බැංකු ගිණුම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු 31 ක කෘෂිකාර්මික ණය, බඩඉරිඟු ණය, ව්‍යාපෘති ණය, අස්වනු නෙලීමේ | මෙම ණයකරුවන් ගොවිජන විනිශ්චය | ණය ලබා දීම හා කාලීනව ණය අය |

| | | | |
|---|---|---|---|
| | ණය, සාර ලංකා ව්‍යාපෘති ණය හා සිතමු කාන්තා ව්‍යවසායක ණය නිකුත් කිරීමට අදාළව ගොවීන් 2238 දෙනෙකු ගෙන් රු.55,459,187 ක ණය මුදලක් හා ගොවීන් 1318 දෙනෙකු ගෙන් රු.8,679,128 ක පොලී මුදලක් අය කර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභාවට සහ අධිකරණය වෙත යොමු කර ඇතත්,සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි. | සභාවට සහ අධිකරණය වෙත යොමු කර ඇති බව. | නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කර නිලධාරීන් අවභාවිතාවක් සිදු කර ඇත්නම් ඊට අදාළ පියවර ගැනීමත්, හිඟ ණය කඩිනමින් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු 20 ක කෘෂිකාර්මික ණය, බඩඉරිඟු ණය, සාර ලංකා ණය, ව්‍යාපෘති ණය, සිතමු කාන්තා ව්‍යවසායක ණය, අස්වනු නෙලීමේ ණය, සාර භූමි ණය හා අස්වනු සුරැකීමේ ණය නිකුත් කිරීමට අදාළව ගොවීන් 1821 ක ගෙන් රු.63,465,865 ක ණය මුදලක් හා ගොවීන් 1328 ක ගෙන් රු.11,946,979 ක පොලී මුදලක් අය කර ගත යුතුව පැවතුණි. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | ගොවිජන බැංකු 15 ක කෘෂිකාර්මික ණය, බඩඉරිඟු ණය, ව්‍යාපෘති ණය, සිතමු කාන්තා ව්‍යවසායක ණය හා සෞභාග්‍යා ව්‍යාපෘති ණය නිකුත් කිරීමට අදාළව ගොවීන් 1250 ක ගෙන් රු.25,140,612 ක ණය මුදලක් හා ගොවීන් 978 ක ගෙන් රු.5,748,647 ක පොලී මුදලක් අය කර ගත යුතුව පැවතුණි. | ගොවීන් 298 ක් සඳහා අවසන් සිහි කැඳවීම් ලිපි යවා ඇති බවත්, ගොවීන් 952 ක් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |
| (ඊ) | පරංගියාවාඩිය ගොවිජන බැංකුවේ 2015/2016 හා 2017/2018 මහ කන්නයන්වල දී ගොවීන් 75 ක් වෙත ලබා දුන් බඩඉරිඟු ණය මුදල් හා සිතමු කාන්තා ව්‍යවසායක ණය මුදලින් එකතු වටිනාකම රු.768,519 ක ණය මුදලක් හා රු.318,552 ක පොලී මුදලක් ගිවිසුම්වල පවත්නා අඩුපාඩු හේතුවෙන් අය කර ගැනීමට නොහැකිව පැවතුණි. | ගිවිසුම්වල අඩුපාඩු හේතුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට බාධා පැන නැඟී ඇති අතර ඉදිරි කටයුතු සඳහා නියෝජ්‍ය කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව. | ණය ලබා දීමේ දී විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු අතර ණය අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | ඉපලෝගම ගොවිජන සේවා මධ්‍යස්ථානය සතුව ණය ගිවිසුම් නොමැති වීම, ණයගැතියන් මිය යාම වැනි හේතු මත එකතු වටිනාකම රු.479,805 ක් වූ ගොවීන් 17 කට ලබා දුන් වගා ණය හා ගොවීන් 10 කට ලබා දුන් ව්‍යාපෘති ණය සහ පොලී මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | සිහිකැඳවීම් සහ අවසන් නිවේදන යොමු කර ඇති බව. | ණය ලබා දීමේ දී ණය ගිවිසුම් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු අතර, හිඟ ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2024 වර්ෂය තුළ දී ගොවිජන බැංකු 09 කට අදාළ වසම් 268 ක් අතරින් වසම් 72 ක් මඟින් කිසිදු වගා ණයක් නිකුත් කර නොතිබුණු අතර, වසම් 139 ක් මඟින් කිසිදු ව්‍යාපෘති ණයක් නිකුත් කර නොතිබුණි. | ඉදිරියේ දී සියලු වසම් ආවරණය වන පරිදි ණය ලබා දීමට උත්සාහ දරන බවත් ලබා දෙන ණය ප්‍රමාණවත් නොවන බව ජනතාව පවසන බව. | ගොවි බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (එ) | කැකිරාව ගොවි බැංකුවේ 2024/2025 කන්නයට අදාළව අසම්පූර්ණ ණය අයදුම්පත් 07 ක් සඳහා එකතු වටිනාකම රු.840,000 ක ණය මුදල් නිකුත් කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණය ලබා දීම් විධිමත්ව සිදු කළ යුතු අතර, අවධිමත්ව කටයුතු කළ නිළධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඒ) | ගොවිජන බැංකුවේ කොටස් ලෙජරය පරීක්ෂා කිරීමේ දී සාමාජිකයින් විසින් කොටස් අයිතිය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 1998 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ අවුරුදු 25 කට ආසන්න කාලයක් තුළ ගොවිජන බැංකු 04 ක් විසින් ආරම්භ කරන ලද කොටස් ගිණුම් 5464 කින් කොටස් ගිණුම් 1248 ක් ආරම්භක තැන්පතුවට පමණක් සීමාවී තිබුණි. | වසම් භාර නිලධාරීන් දැනුවත් කර ඉදිරියේ දී ගිණුම් සක්‍රීය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | කොටස්කරුවන් දැනුවත් කර ඔවුන් සක්‍රීයව ගොවිජන බැංකුව සමඟ දායක කර ගැනීමට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 දරන චක්‍රලේඛය අනුව සියලුම ලියාපදිංචි ගොවි සංවිධානවල ගනුදෙනු අදාළ ගොවිජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් මඟින් සිදු කළ යුතු වුවත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක පැවති ගොවි සංවිධාන 173 කින් ගොවි සංවිධාන 110 ක් ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවි සංවිධාන දැනුවත් කර ගිණුම් ආරම්භ කරවීමට කටයුතු කරන බව. | ගොවි සංවිධාන ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීමට පෙළඹවීමට වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඕ) | නැගම්පහ ගොවිජන බැංකුවේ සේවය කළ ගොවි බැංකු නිලධාරිනිය විසින් අවභාවිතා කර තිබුණු රු.2,421,653 ක මුදලින් රු.2,178,208 ක මුදලක් ආපසු අය කර ගෙන තිබුණු අතර, තවදුරටත් රු.243,445 ක ශේෂයක් අය විය යුතුව පැවතුණි. මෙම මුදල් අවභාවිතාව සම්බන්ධව මුදල් රෙගුලාසි 104 හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31 වැනි වගන්තිය ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අක්‍රමිකතාව සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂාවන් සිදු කර ආයතන සංග්‍රහය ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | 2015 වර්ෂයේ සිට පලුගස්වැව ගොවිජන බැංකුවේ සේවය කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී විසින් රු.1,600,000 ක මුදලක් අවභාවිතා කර නැවත ගොවිජන බැංකුව වෙත බැර කර තිබීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මෙම අක්‍රමිකතාවය සිදුකළ නිලධාරිනියට විරුද්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31 වැනි වගන්තිය ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - |
| (ග) | මිහින්තලේ 2001 වර්ෂයේ සීමා සහිත ජනතා ලංකා මිරිස් අලෙවි ගොවි සමාගම වෙත ලබා දී තිබුණු රු.1,275,000 ක ණය මුදලට අදාළ රු.1,975,233 ක පොලී මුදල සමාලෝචිත වර්ෂයේ 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන විනිශ්චය සභාවට යොමු කර ඇත. | කාලීනව ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, හිඟ ණය කඩිනමින් අය කර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය. |
| (ච) | නොච්චියාගම ගොවි බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල 2009 සිට 2019 අතර කාල පරාසයක සිට පැවත එන රු.2,782,707 ක් වූ ගෙවිය යුතු ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |